සැ. යු. - 2021.09.03 වැනි දින අංක 2244 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,245 - 2021 සැප්තැම්බර් මස 10 වැනි සිකුරාදා - 2021.09.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1892 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1892 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 ඔක්තෝබර් මස 01 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 සැප්තැම්බර් මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

සංශෝධනයයි

**2022 වර්ෂයේ නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම**

ඉහත කරුණ සම්බන්ධයෙන් 2021.08.06 දින පළ කරන ලද නිවේදනයේ ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය 2021.10.07 දින පෙ. ව. 10.30 ලෙසට සංශෝධනය වන බව මෙයින් දන්වා සිටිමි.

ඩබ්. පී. සී. එන්. පතිරණ,
ප්‍රාදේශීය ලේකම්,
නාරම්මල.

2021 සැප්තැම්බර් මස 07 වැනි දින,
නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09-95

---

# රජයේ නොවන දැන්වීම්

**ඇටෝර්නි බලය අවලංගු කිරීම**

දෙහිවල, අංක 49, වෙන්ඩවට් පෙදෙස දරන ස්ථානයේ පදිංචිව සිට දැනට යුනිට් 1, කෙන්ට් ස්ට්‍රීට්, සවුත් පිලිම්ප්ටන් 5038, දකුණ ඕස්ට්‍රේලියාව දරන ස්ථානයේ පදිංචි නව ජාතික හැඳුනුම්පත් අංක 198864300450 හිමි සහ පැරණි ජාතික හැඳුනුම්පත් අංක 886430450 V හිමි ෆාතිමා සෆ්නා මික්දාර් වන මම වර්ෂ 2019 ක් වූ මාර්තු මස 02 වැනි දින කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එෆ්. අයි. අන්වර් මහතා විසින් ලියා සහතික කරන ලද අංක 2871 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රයෙන් අංක 49, වෙන්ඩවට් පෙදෙස, දෙහිවල, දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 928283771 V හිමි ෆාතිමා සහ්මා මික්දාර් හට දෙන ලද ඇටෝර්නි බලය වර්ෂ 2021ක් වූ අගෝස්තු මස 30 වැනි දින සිට අවලංගු කරන ලද බවත්, එදිනට පසු ඇය විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා වග නොකියන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය සහ මහජනතාව වෙත මින් දන්වා සිටිමි.

ෆාතිමා සෆ්නා මික්දාර්.

09-89

---

**විශේෂ ඇටෝර්නි බලය අවලංගු කිරීම**

හලාවත, කාක්කපල්ලිය, පොන්නන්කන්නිය දරන ස්ථානයේ පදිංචි බස්තියන් කෝරාලලාගේ චමිල අසංක රුද්‍රිගො වන මා විසින් එම ලිපිනයේ ම පදිංචි බස්තියන් කෝරාලලාගේ විල්මන් රුද්‍රිගු යන අය හට ප්‍රදානය කරන ලද පුත්තලම් දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. ලලිත් රණසිංහ විසින් සහතික කරන ලද 2013.07.17 වැනි දිනැති අංක 7972 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙහි සඳහන් දින සිට අවලංගු වී අහෝසි වන අතර, එය බල පැවැත්වීමක් නොවන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත සහ මහජනතාව වෙත මින් දන්වා සිටිමි.

බස්තියන් කෝරාලලාගේ චමිල අසංක රුද්‍රිගො.

2021 ජුනි මස 26 වැනි දින.

09-96

## ජේ කේ ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

පීවී 130036

**ස්වෙච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම**

වර්ෂ 2021 ක් වූ අගෝස්තු මස 26 වැනි දින යථා පරිදි රැස්වී පවත්වන ලද ජේ. කේ. ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ සාමාජිකයන්ගේ අති විශේෂ මහා සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනා සම්මතය විශේෂ යෝජනා සම්මතයක් ලෙස සම්මත කරන ලදී.

**විශේෂ යෝජනා සම්මතය**

(1) 2007 අංක 07 දරන සමාගම් පනතේ 319 (1) (ආ) වගන්තියේ නියමයන් ප්‍රකාරව සමාගම ගණන් බේරා වසා දමන බවට, සහ

(2) සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් එකඟ වනු ලබන වේතනයකට යටත්ව සමාගමේ කටයුතු ගණන් බේරා වසා දැමීමේ කාර්යය සඳහා කොළඹ 02, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, අංක 117 හි එන්. ඩබ්ලිව්. තම්බයියා මහත්මිය කේ. ක්‍රිෂ්ණකුමාර් මහත්මිය සහ එන්. ඒ. කේ. එම්. කුරේ මහත්මිය ඈවරකරුවන් වශයෙන් මෙයින් පත්කරනු ලබන බවට, යෝජනා සම්මත කරනු ලැබේ.

කීල්ස් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 117, සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

09-81

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.